

# ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය

මිදීම පිළිබඳ බයිබල් ඉගැන්වීම.

# ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය

## මිදීම පිළිබඳ බයිබල් ඉගැන්වීම.

අපගේ සිතුවිලි ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය දෙසට හැරෙන විට, අපට ඇතිවන්නේ කිනම් ආකාරයේ චිත්තරූපයක්ද? අප කුරුසිය දකින්නේ ශ්‍රේෂ්ඨත්වය සහ කීර්තිය ඇති දෙයක් ලෙසද? කුරුසිගත කිරීම ගැන අපට ඇත්තේ උණුසුම් භාවානුගත හැඟීම්ද?

## කුරුසිගත කිරීම.

යතාර්ථයේදී එය පැහැදිලි සහ බියකරු දර්ශනයක් විය. කුරුසිගත කිරීම සියලු මිනිස් නිපැයුම් අතුරින් වඩාත්ම බියකරු එකක් වන්නට ඇත. සමහර අවස්ථාවන්වලදී කුරුසිගත කිරීමට පෙර කසපහර දෙන ලදී. වරදකරු කරන ලද මිනිසාට, අස්ථි හෝ ලෝහ කැබලි සවි කරන ලද හම් කස පටි වලින් කසපහර දෙන ලදි. කසපහර හේතුවෙන් මිනිසුන් මිය යන අවස්ථාද විය. ඉන්පසු වූදිතයා දැව කුරුසියක, අත් සහ පා තුළින් ඇණ ගසා එය සිරස් පිහිටීමකට ඔසවා පොළවේ තදින් සවි කරන ලදි. ඉන් පසු ඔහු සරළව මිය යැමට ඉඩහරින ලදී. ඔහු නොමරන ලදි. නමුත් බේරී යැමට නොහැකි පිහිටීමක ඇණ ගසා, මරණය ඔහු බිලි ගන්නා තෙක් තිබෙන්නට ඉඩ හැරියේය.

ජීවිතය යනු දැඩි වධයක් වුවත්, තිරිසන් සහජාසයකින් ජීවත්ව සිටීමට මිනිසා අරගල කරනු ඇත. එහිම බරට යටත්ව, ඔහුගේ ශරීරය ඉදිරියට ඇද වැටී පෙනහලු සම්පීඩනය කර ආශ්වාසය සීමා කරයි. නමුත් නැවත නැවතත් සිදුරු කරන ලද අත්වල සහ පාදවල ඉමහත් වේදනාව නොතකා ජීවත් වීමට ඔහු හුස්ම ඇද ගැනීම සඳහා පපුව ඉහළට ආයාසයෙන් ඔසවයි. අවසානයේදී අස්වැසිල්ලක් ලෙස මරණය එනු ඇත. නමුත් පැය ගණන් හෝ - සමහර විට දින ගණනක් - විස්තර කළ නොහැකි දැඩි වේදනාවෙන් පසුව පමණි.

ස්වාමින්වහන්සේ කුරුසිය මත පැය හයකින් පසු මියගිය අතර, එතරම් ඉක්මනින් උන්වහන්සේ මියගිය නිසා පිලාත් පුදුමයට පත්විය (මාර්ක් 15:44)

රෝමානුවන් පාලනය කළ දවස්වල කුරුසිගත කිරීම පිළිකුලෙන් සහ ජුගුප්සාවෙන් සලකන ලදි. වරදකරුවා - සාමාන්‍යයෙන් භයානක දේශපාලනික සතුරෙක් හෝ නිවැරදි කිරීමට නොහැකි අපරාධකරුවෙක් - ඉහළට ඔසවා අකීකරුකම නොඉවසන බැව් පෙන්වීමේ බියකරු අවවාදයක් ලෙස තබන ලදි.

මෙම බියකරු දර්ශනය දුටු අය සාමාන්‍යයෙන් පාඩම ඉගෙන ගත්හ.

"ලැජ්ජාව නොසලකා කුරුසිය දරාගත්" බැව් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අරභයා ලියා තිබේ. (හෙබ්‍රෙව් 12:2) එතරම් නින්දිත මරණයක් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයාට නොදෙන්නේ යැයි පවසන සමහරු එම නිසා යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා වන්නට නොහැකි බව තර්ක කරත්.

## <u>යුදෙව් කුමන්ත්‍රණය</u>

යේසුස්වහන්සේ කුරුසිගත කිරීම එකතුවී කරන ලද මෙහෙයුමක් විය. යුදෙව්වන් සැලසුම් කළ අතර රෝමානුවන් එය ක්‍රියාවට නැංවිය.

පළමුවරට යේසුස්වහන්සේගේ ප්‍රස්තුතය යුදෙව්වන් දැනගත් විට ඔවුන් බලාපොරොත්තුවෙන් සහ උත්තේජනයෙන් පිරුණි. රෝමවරුන් ඔවුන්ගේ නිදහස සොරාගෙන තිබූ අතර, ඔවුන් එය නොරිස්සුවේය. ඔවුන් හට තමන්ගේම රජ කෙනෙක් උවමනා වූ අතර ඔවුන් උන්වහන්සේ හැඳින්වූ ලෙස නාසරීය යේසුස්, එම පදවියට සුදුසු අපේක්ෂකයෙකු ලෙස දිටිය. උන්වහන්සේ තුළ <u>සියලු</u> සුදුසුකම් ඇතැයි පෙනුනි.

රජෙකු වීමට යේසුස්වහන්සේ නිශ්චයවී සිටි ඇති නමුත් - දනුදු එසේය - පළමුව තවත් කාර්යයන් ඉටු කරීමට තිබුණි. විශේෂයෙන්ම වැදගත් වූයේ උන්වහන්සේ මුල් සේවයේ කන්ද උඩ දේශනාවේදී කළාක් මෙන්, මනස්ථාපය ගැනත් පෞද්ගලික ශුද්ධවන්ත භාවය ගැනත් දේශනා කිරීමය. මෙම සදාචාර අවංකත්වය ගැන අවධාරණය යුදෙව් නායකයෝ අගේ නොකළහ. උන්වහන්සේගේ වචනයෙන් පමණක් නොව, උන්වහන්සේගේ චරිතයේ අතිමහත් ශුද්ධභාවය නිසා ඔවුන් දෝශාරෝපනයට ලක් වූයේ යැයි ඔවුන්ට හැඟුණි. තවද සාමාන්‍ය ජනතාව සමගවූ උන්වහන්සේගේ ජනප්‍රියභාවයට ඔවුන් ඊර්ෂ්‍යා කළහ.

## රෝමානු සැකය

මෙම ජනප්‍රියතාවය තවත් හේතුවක් නිසා ලැජ්ජාවට කාරණයක් විය. නායකයෝ තවදුරටත් යේසුස්වහන්සේ නිෂ්චය වූ රජකෙනෙකු ලෙස නොසිතූ නමුත් සාමාන්‍ය ජනතාව තවමත් එම අදහසට ආකර්ෂණය විය. ජනතාවගේ ප්‍රබෝධය රෝමානුවන් තුළ සැක පහළ කළ හැකිව තිබුණු අතර යුදෙව් නායකයෝ ඔවුන් "අපේ ස්ථානයත් අපේ ජාතියත් පැහැර ගන්නවා ඇතැයි" බිය වූහ. (යොහාන් 11:47-48)

එම නිසා උන්වහන්සේ ඉවත් කරන්නේ කෙසේද? පළමුව මෙම මිනිසා ඉවත් කිරීම සඳහා බලවත් හේතු තිබෙන බව ඔවුන් සහ තම යුදෙව් සගයන් පොළඹවා ගත යුතුව තිබුණි. සැබෑ හේතු - යේසුස්වහන්සේ ගැන තිබූ ඊර්ෂ්‍යාව සහ රෝමවරුන්ට තිබූ බිය - ප්‍රචාරය කිරීමට නොහැකි වූ අතර ඒවා සැඟවීමට ගත් උත්සහයද විශේෂයෙන් සාර්ථක නොවූහ. එසේ නම් "නිලළත්" හේතුව කුමක් විය යුතුද? අල්ලස්දී ගෙන්වාගත් සාක්ෂිකරුවන් එකිනෙකාට ප්‍රති විරුද්ධව ගොස් සියල්ල අවුල්කර ගත්තාට පසු, තමන් ඉහළ ප්‍රතිපත්ති වලින් යුත් මිනිසුන් සේ පෙනෙන චෝදනාවක් ඔවුහු සොයා ගත්හ.

යේසුස්වහන්සේ තමන් දෙවියන්වහන්සේගේ පුත්‍රයා යයි කියා තිබුණි. එහි හිමිකම සත්‍ය වුවත්, ඔවුන් එය දේව අපහාසයක් යැයි කී අතර, දේව අපහාසයට මරණීය දණ්ඩනයෙන් දඬුවම් නියම කෙරිනි. උන්වහන්සේගේ ඉරණම තිරණයවී තිබුණි.

නමුත් තවත් එක් ගැටළුවක් විය. රෝමවරු ඔවුන්ගේ ස්වාමින්වූ අතර, රෝමවරුන් විසින් වැරදිකරුවන් කළ අය පමණක් මරණයට පත්කිරීමට හැකි විය. - එයද රෝමවරුන්ම විසින් පමණි. එම නිසා උන්වහන්සේ නැසීම සඳහා රෝමවරු පොළඹවා ගැනීමට ඔවුන්ට සිදු විය. නාසරිය යේසුස් තමන් දෙවියන් වහන්සේගේ පුත්‍රයා බැව් කීවේ යැයි ඔවුන්ට කීමෙන් පළක් නැති විය. අවිචාරලබ්ධියෙන් හෙබි රෝමවරු මෙම උතුම් අයිතිවාසිකම නිසා උන්වහන්සේට ගෞරව කරන්නටද ඉඩ තිබුණි. එය මරණීය දඬුවමක් දිය හැකි චෝදනාවක් ලෙස ස්ථිරවම නොසිතනු ඇත. ඉතින් වංකව, යුදෙව් නායකයෝ රෝමානු පාලකයා වූ පිලාත් හට, මෙම මිනිසා යුදෙව්වන්ගේ රජ ලෙස ප්‍රකාශ කළ බවත්, තමන් සීසර් හැර වෙන රජකෙනෙකු පිළි නොගන්නා බවත්, පැමිණිළි කලහ. එම නිසා රෝමානු රජයට ඔහු තර්ජනයයක් බැව් ඔවුහු තර්ක කළහ.

ඔබ මේ මිනිසාට යන්ට දෙන්නේ නම්, ඔබ සීසර්ගේ මිතුරා නොවේ යැයි ඔවුහු පිලාත්ට කීහ. (මෙයට ටික කලකට පෙර රෝමයෙන් නිදහස් වීමට ඔවුන්ට උවමනා වූ බැවින්, ඔවුන්ට යේසුස්වහන්සේ පිළිගන්නට හැකියාව තිබුණු බව මතක තබා ගන්න!)

මෙම කපටිකම පිලාත් දුටු නමුත් තමා සීසර් හට අපක්ෂපාති යැයි වාර්ථා කිරීම ගැන බියෙන් ඔවුන්ගේ ඉල්ලීමට යටත්වීමට බල කරන ලදී.
එසේ යේසුස්වහන්සේ කුරුසිගත කරන ලදී.

## දෙවියන්වහන්සේගේ පුත්‍රයාට එරෙහි කුමන්ත්‍රණය

ක්‍රිස්තුස්වහන්සේ කුරුසිගත කිරීම සුලු මෙහෙයුමක් නොවීය. කොපමණ මිනිසුන් සංඛ්‍යාවක් සහ වර්ගයක් සහභාගි වූවා දැයි සාමාන්‍යයන් සලකා බලන්නේ නැත. රෝමානුවන් නියෝජනය කරමින් හෙරෝද් රජද, පාලක පිලාත්ද, සියයකට මුලාදෑනියෙක් සහ සාමාන්‍ය භේවායෝ සිටියහ. විරුද්ධ යුදෙව් කොටස් දෙකක් - ඵරිසිවරු සහ සද්දුසිවරු - සහභාගිවී සිටියහ. ඵරිසිවරු බොහෝ කොට පටු මානසිකත්වයෙන් යුත් දැඩි ආගම් භක්තික ලියන්නන්ගෙන් සැදුනි. සද්දුසි පක්ෂයට පුළුල් මනසින් යුත් සුඛවිහරණයට ආශාකල පූජකයන් අයත් වූයේය. යුදාස් නමින් යුත් ද්‍රෝහි අපෝස්තුළු වරයෙක්ද, බරබ්බස් නම් මිනීමරුවෙක්ද යුදෙව් චෝදනාකරන්නවුන්ගෙන් සැදි කුඩා සමූහයක්ද මෙම විස්මිත සතුරු එකතුවේ සිටියහ.

විරුද්ධ වාර්ගිකයන් එකට ඇදුනු සැටි බලන්න. සාමාන්‍යයෙන් යුදෙව්වන් සහ රෝමානුවන් එකිනෙකාට වෛර කලහ. ඵරිසිවරුන් හෝ සද්දුසිවරුද එසේමය. ඇත්තටම යේසුස්වහන්සේගේ නඩු විභාගය තෙක් පිලාත් සහ හෙරෝද් සතුරන් වූහ. දෙවියන්වහන්සේගේ පුත්‍රයා මරණයට පත් කිරීම සඳහා කුමණ්ත්‍රනය කිරීමට එකතු වූයේ පුදුම මිනිසුන් මිශ්‍රණයකි. එක් භයානක පොදු සතුරෙක් නිසා වෙනස්කම් ගිල්වා දමන ලදි.

## නාසරීය යේසුස්ගේ අභියෝගය

මෙතුවක් කල් ජීවත්වූ මිනිසුන් අතරින් සම්පූර්ණයෙන්ම ධර්මිෂ්ඨවූ මිනිසා මෙම සතුරා විය. කිසිම මිනිසෙකුට, කිසිම මිනිස් කණ්ඩායමකට අයත් නොවූ පුද්ගලයකු විය. ඔවුන් අතර වෙනස්කම් කොපමණ වුවත් ඔවුන් එකිනෙකාගේ සමාගමයට වඩා මෙම මිනිසා හා සමාගමය වඩා අපහසු විය. මෙම නානාප්‍රකාර පව්කාර මිනිසුන් හට අසමසම ධර්මිෂ්ඨ මිනිසාවූ යේසුස්වහන්සේ සමඟ කිසිම පොදු බවක් නොතිබුණි. යේසුස්වහන්සේ ලෝකයට අභියෝගයක් විය.

උන්වහන්සේගේ උගැන්වීම් හා උන්වහන්සේගේ ජිවිතයේ ගුණය සියලු මිනිසුන්ට දෝෂාරෝපණයක් විය.

යේසුස්වහන්සේ තවමත් ලෝකයට අභියෝගයක්ය. ලෝකයට අයත් සියයල්ලෝ උන්වහන්සේ කුරුසිගත කළ අයගේ පැත්තේය. අප ලෝකයට අයත්නම්, අපද ක්‍රිස්තුස්වහන්සේ කුරුසිගත කළ අයගේ පංතියට අයත්ය. මිනිස් ස්වභාවය ගැන කොතරම් කම්පාකරවන ලද විවරණයක්ද, දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨ පුත්‍රයා පෘතුවියෙහි ජිවත්වන විට ඔහු නොමැතිව ජිවත් වීම වඩා වාසිදායක යැයි මිනිසුන් තිරණය කලහ. සිත සාදාගත් විට, ඔවුන් කිසිවකින් නොනැවතුනි - මුසාව, කුහකකම, නිති විරෝධි නඩු විභාගය, අල්ලස්, බොරු සාක්‍ෂි, කප්පම්, වධ හිංසා, ඝාතන.

යුදෙව්වරුන්ට පමණක් දෝෂාරෝපණය කරන්නන්ගෙන් වැදගත් කරුණක් ගිලිහි ඇත. කරුණ නම්, දෙන ලද තත්වයන් යටතේ ඕනෑම තවත් ජාතියක් එම ආකාරයටම ක්‍රියා කරණු ඇති බවය. සමහර විට, මෙම විදග්ද යුගයේ කථාවේ <u>සුවිශේෂය</u> පමණක් වෙනස් ආකාරයකින් සැලසුම් කරනවා ඇත. නමුත් <u>චේතනා</u> සහ <u>අවසානය</u> එකක් වනු ඇත.

දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට කීකරුවීම ජිවිතයේ එකම අරමුණ කරගත් පුද්ගලයකු, මනුෂ්‍යයන්ට ඉවසා දරා සිටීමට නොහැකිය. එය වෙනත් ආකාරයකින් ප්‍රකාශ කරනවා නම්ඃ දෙවියන් වහන්සේට අවශ්‍ය ප්‍රමිති මිනිසා ප්‍රතික්ෂේප කරයි. ඔවුගේම මිනිස් සභජාසයට කීකරු වීමට ඔවුන් වැඩි කැමැත්තක් දක්වයි. මේසහජාසයන් මොනවාද? ස්වාමිවූ යේසුස්වහන්සේටමප්‍රකාශ කරන්නට ඉඩ හරිමු.

"ඇතුළතින් එනම් මනුෂයයන්ගේ සිතින් නපුරු සිතුවිලි වේශ්‍යාකම, සොරකම්, මිනිමැරුම්, කාමමිත්‍යාචාරකම්, තණ්හා, දුෂ්ඨකම්, වංචාව, සල්ලාලකම්, ඊර්ශ්‍යාව, අපහාස කිරීම

උඩඟුව සහ මෝඩකම නික්මෙයි. මේ සියලු නපුරුදේ ඇතුලතින් නික්මී මනුෂ්‍යයා අපවිත්‍ර කෙරේ." (මාර්ක් 7:21-23)

පාවුල් මිනිස් ස්වභාවයේ විස්තරය සම්පූර්ණ කරයි. "යුදෙව්වරුද ග්‍රීකවරුද.....පාපයට යටත්ව සිටිති......ඒ ගැන මෙසේ ලියා තිබේ. ධර්මිෂ්ඨ කෙනෙක් නැත, එසේය, එක්කෙනෙක්වත් නැත, තේරුම්ගන්නාවූ කිසිවෙක් නැත, දෙවියන්වහන්සේ සොයන්නාවූ කෙනෙක් නැත......ඔවුන්ගේ ඇස් හමුයෙහි දෙවියන්වහන්සේ කෙරෙහි භයක් නැත."
(රෝම 3:9-18)

අප ගැන - පිළිකුල් සහගත චිත්‍රයක්ය.

<u>දෙවියන්වහන්සේගෙන් මිනිසා වෙන්වීම.</u>

දෙවියන්වහන්සේගෙන් මිනිසා වෙන්වීමේ දුක්බර කතාපුවත ආදම් දක්වාම අතීතයට යන අතර, උත්පත්ති පොතේ පළමු පරිජේද වල එය කියනු ලබයි. බයිබලය ඉදිරිපත් කරන පළමුවැනිම යථාව නම් දෙවියන්වහන්සේ මැවුම්කරුවාණෝ බවයි. උන්වහන්සේ ස්වර්ගයත්, පෘතුවියත් මිනිසා ඇතුළු පෘතුවිය මත සියලු දේත් මැවූ සේක. මිනිසාගේ මැවීම මෙසේ සංෂිප්තගත කරයි.

"ස්වාමිවූ දෙවියන්වහන්සේ භූමියේ දූවිල්ලෙන් මනුෂ්‍යයා සාදා ඔහුගේ නාස්පුඩු තුළට ජීවනයේ හුස්ම හෙලූ සේක, එවිට මනුෂ්‍යයා ජීවමාන ප්‍රාණියෙක් විය" (උත්පත්ති 2:7)

දැන් සිතන්න, ස්වර්ගයත් පෘතුවියත් ඒවායේ අඩංගු සියල්ලෙත් මැවුම්කරු දෙවියන්වහන්සේ නිසා, සියල්ල උන්වහන්සේට අයත්ය. සියල්ලෙහි උරුමය උන්වහන්සේගේ නිසා සියල්ල උන්වහන්සේගේ අණසක යටතේය.

උන්වහන්සේගේ වචනය නිතියයි, ඉතින් උන්වහන්සේ ඔහුම සූදානම් කළ උයනට මිනිසා දැමූ විට, උන්වහන්සේ ඔහුට කළ යුතු සහ නොකල යුතු දේ ගැන උපදේශ දීම යුක්තිසහගතය. (මෙම ප්‍රකාශයකිරීම කෙතරම් පුදුම සහගතද) දෙවියන් වහන්සේගේ උපදේශ මෙසේ විය:

"නුඹට උයනේ සියලූ ගස් වලින් කැමති ලෙස කන්ට පුලුවන. එහෙත් යහපත හා නපුර දැන ගැනීමේ ගසෙන් කන්ට එපාය, මක්නිසාද එයින් කෑ දවසෙහි ඒකාන්තයෙන්ම නුඹ නසින්නෙහිය" (උප්පත්ති 2 : 16-17)

<u>ඒදනයේ ඛේදවාචකය</u>

උත්පත්ති 3 පරිච්ඡේදය කථාව ඉදිරියට ගෙනයයි. ආදම්ගේ අකීකරු කමත්, මෙම අකීකරුකමේ ප්‍රතිවිපාකත් ගැන එය පවසයි. දෙවියන්වහන්සේ ආදම් මත මරණීය දණ්ඩනය ප්‍රකාශ කළහ.

"නුඹ භූමියෙන් ගන්නා ලද බැවින් එයට හැරී යනතෙක් නුඹේ මුහුණේ දහඩියෙන් යුක්තව කෑම කන්නෙහිය, මක්නිසාද නුඹ දූවිලිය, දූවිල්ලට හැරී යන්නෙහිය." (උත්පත්ති 3:19)

ඉතිරි මනුෂ්‍යවර්ගයා මත මෙහි ප්‍රතිපලය පාවුල් විසින් වාර්තා කරනු ලබයි.

"එක් මනුෂ්‍යයෙකු කරණකොටගෙන පාපයත්, පාපය කරණකොටගෙන මරණයත් ලෝකයට ඇතුල්වුනාක් මෙන්, සියලූ මනුෂ්‍යයන් පව් කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණය පැමිණියෝය". (රෝම 5:12)

සමාන තැනැත්තා සමාන යමක් ජනිත කරයි. අකීකරුවීමෙන් ආදම් පව්කාරයෙක් වූ අතර ඔහුගේ දරුවෝ පාපයේ මාර්ගයේ ඔහු අනුගමනය කරති.

අපගේ පෞද්ගලික අත්දැකීම් වලින් අප දන්නා පරිදි දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට විරුද්ධ වීමට සියලු මනුෂ්‍යයන් තුළ බලවත් නැඹුරුවක් ඇති බැව් ශුධවූ වචනය ප්‍රකාශ කරත්. ආදම් මරණීය දඬුවමට නියම කළ අතර, ඔහුගේ පැවතෙන්නාවූ පාපයෙන් පහර කෑ මනුෂ්‍ය වර්ගයා - ශුද්ධවූ වචනයේ ප්‍රකාශයක් වූ "ආදම් තුළ"ඉන්නාවූ අය - එසේම මරණයට යටත් වන්නෝය, සියල්ලෝ පවුකළ බැවින්, සියලු මිනිසුන් මත මරණය පැමිණුනි.

<u>පාපය සහ මරණය</u>

පාපය නිසා මිනිසා මරණයට යටත් නම් යථාර්තය ශුද්ධවූ වචනය අවධාරණය කරයි. ඉහත උද්ධෘතයට නගන ලද රෝම 5:12, පාපය සහ මරණය අතර ඇති සම්බන්ධය අවධාරණය කරන පද වලින් එකක් පමණි. නිතරම උපටා දක්වන "පාපයේ කුළිය නම් මරණය", රෝම වරුන්ගේ ඊලඟ පරිච්ඡේදයේ (6:23) සඳහන් වන අතර, ඊට පසු පරිච්ඡේදයේ "ව්‍යවස්ථාවෙන්වූ පාප තෘෂ්ණා, මරණයට ඵල උපදවනපිණිස අපේ අවයව තුළ ක්‍රියා කළේය" (7:15) සඳහන්ය.

සත්‍යයේ පිහිටියේ කවුද - දෙවියන්වහන්සේද ආදම්ද? පැහැදිලිවම දෙවියන්වහන්සේ නිවැරදිය. පැහැදිලි අවවාදයක්දී තිබියදීත් ආදම් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කඩකර දඬුවම ගෙව්වේය. නමුත් මිනිසාගේ තීන්දුව නම් ආදම් නිවැරදි බවත් දෙවියන්වහන්සේ වැරදි බවත්ය. මෙය බොහෝ වචන වලින් මිනිසුන් සාමාන්‍යයෙන් නොකීවත්, ඔවුන්ගේ ක්‍රියාවෙන් සහ ආකල්ප තුලින් ඔවුන්ගේ ගෞරවය සහ අනුකම්පාව ආදම්ට මිස දෙවියන් වහන්සේට නොවන බැව් පෙන්වයි. මාර්ග දෙකකින් ඔවුහු මේ ආකල්පය ප්‍රකාශ කරත්:

(1) පාපය අනුමත කිරීමෙන්
(2) මරණය පිළකුල් කිරීමෙන්

## මනුෂ්‍යයාගේ සාධාරණ විපාකය

තමන්ගේම ක්‍රියාවලින් ඔවුන් අකිකරුකමේ මාර්ගය අනුමත කරන බැව් සියලු මනුෂ්‍යයෝ ප්‍රදර්ශනය කරත්. මිනිස් ස්වභාවය ගැන උගන්වන ශුද්ධ වචනය දෙස අපි දැනටමත් බලා ඇත්තමෙු. බොහෝ අය බය නැතිව උවමනාවෙන්ම දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථා ප්‍රතික්ෂේප කරත්, අනෙක් අය දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ගණනකට නොගෙන ඔවුනට උවමනා දෙය කරත්, අනෙක් අය දෙවියන්වහන්සේට බිය ඇති බව පිළිගනිමින්, දෙවියන්වහන්සේ ඔවන්ගෙන් බලාපොරොත්තු වන දේ වෙනුවට තමන්ට උවමනා දේ කිරීම සාධාරණීය කිරීමට නිදහසට කාරණා දෙති.

ඇත්තටම දෙවියන්වහන්සේට සේවය කිරීමට උත්සාහ කරන ස්වල්ප දෙනාද තමන්ගේ ප්‍රයත්නයන් ගැන සෑහිමකට පත් නොවෙයි. පාපයේ ගුරුත්වාකර්ශණීය බලය ඔවුන් පහලට ඇද දමයි.

“සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනවී සිටිති” (රෝම 3:23)

සියල්ලෝම මරණය ප්‍රතික්ෂේප කරත්, දෙවියන්වහන්සේ මනුෂ්‍ය වර්ගයා මත නියම කළ මරණ දඬුවම ඔවුන් පිළිකෙව් කරත්. බොහෝ අය දකින්නේ තමන්ගේ ක්‍රියාවලට සාධාරණ දීමනාවක් වෙනුවට තමන් රැවටිල්ලට භාජනය කර ඇති බවකි. ඔහු පවුකාරයකු නොවුවත් සදාකල් ජීවත් වීමට අයිතිය යුක්ති සහගතව මිනිසාට ඉල්ලීමට නොහැක. නමුත් පව්කාර මිනිසුන් මරණය, අසාධාරණ සහ කුරිරු දඬුවමක් ලෙස සලකයි.

සැබවින්ම බොහෝ අය කොහෙත්ම මරණය සිදුවන බැව් නොපිළිගනිති. සෑම සාක්ෂියක්ම අනෙකුත් දිශාවට යොමු වුවත්,

මරණය දසුනක් පමණක් බවත් - සත්‍යයක් නොවන බවත් ඔවුන් පවසයි. මිනිසෙකු මිය ගිය විට ජීවිතය ඇත්තටම ආරම්භවේ යැයි ඔවුන් පවසත්. මරණය, වඩා සාරවත් සහ වඩා සම්පූර්ණ ජීවිතයක් සඳහා දොරටුවක් ලෙස ඔවුහු සලකත්

මෙය ශුද්ධ ලියවිලි උගැන්වීම් වලට සම්පූර්ණ විරුද්ධය. අප දුටු පරිදි, මරණය දඬුවමක් ලෙස බයිබලය උගන්වයි. එය කිසි දිනක ප්‍රියජනක හා ආකර්ශණීය යමක් ලෙස අදහස් නොකළේය. බයිබලයට අනුව, මිනිසෙක් මිය යන විට "ඔහුගේ කල්පනාව නැතිවේ" (ගීතාවලිය 146:4), සහ "මළාහු කිසිවක් නොදනිති" (දේශණාකාරයා 9:5) එය සරළව කිවහොත් මරණය යනු ජීවිතයේ අවසානයයි.

පාපය දිගටම කරගෙන යෑමෙන් සහ මරණය ප්‍රතික්ෂේප කිරීමෙන් මිනිසා තම ජීවිත කාලයම දෙවියන්වහන්සේට විරුද්ධව සටන් කලත්, අවසානයේදී දෙවියන්වහන්සේ ඒකාන්යෙන්ම ජයග්‍රහණය කරන අතර, මිනිසා තම ස්වභාවික දූවිල්ලට හැරී යයි. "නුඹ දූවිල්ලය, නුඹ දූවිල්ලට හැරී යන්නේ යයි" දෙවියන්වහන්සේ කීවේ බල රහිතව නොවේ.

## යේසුස්වහන්සේ කුරුසිගත කළේ මක්නිසාද?

යේසුස්ක්‍රිස්තුස්වහන්සේ කුරුසිගත කළේ, යුදෙව්වන් උන්වහන්සේට ඊර්ෂ්‍යා කළ බැවින් සහ උන්වහන්සේ ඉවත් කළ යුතු නිසාත්ය. මෙය එක් පැහැදිලි හේතුවකි. නමුත් ඔවුන් මේ බිහිසුනු අපරාධය කිරීමෙන් වලකා, එම විටම උන්වහන්සේගේ පුත්‍රයාගේ ජීවිතය පිළිකුල් හා වේදනාත්මක කුරුසිගත කිරීමෙන් බේරා ගන්නට දෙවියන්වහන්සේට හැකියාව තිබුණි. පැහැදිළිවම මැදිහත්වී අපරාධය වැලැක්වීමට දෙවියන්වහන්සේ බලසම්පන්න විය. නමුත්, තම පියාණන් හට තෙවරක්ම ස්වාමිවූ යේසුස්වහන්සේ,

"මේ කුසලාන මා කෙරෙන් පහවෙන්ට පුළුවන් නම් එසේ වේවා......." යැයි යාච්ඤා කලත්, දෙවියන්වහන්සේ මැදිහත්වූයේ නැත. දෙවියන්වහන්සේගේ ප්‍රතිපත්ති උත්කෘෂ්ඨ වීමට සහ උන්වහන්සේගේ සැලැස්මට අවශ්‍ය වූයේ උන්වහන්සේගේ පාප රහිත පුත්‍රයා කුරුසිගත කිරීමය.

නමුත්, මිනිසාගේ අකීකරුකමෙන් සහ කුරිරුකමෙන් පාලනය වූ ලෝකයක උන්වහන්සේගේ යහපත් අභිප්‍රාය දෙවියන්වහන්සේ කෙසේ ඉටුකරගත යුතු වීද? දෙවියන්වහන්සේගේ ප්‍රඥාව මාර්ගය සොයා ගති. යේසුස්වහන්සේ මරණයට පත්කිරීමෙන් පව්කාරයන් ජයග්‍රහණය කලාසේ පෙනුනත්, ඇත්ත වශයෙන්ම මිනිසාගේ කුරිරුකම නොසලකා එය යහපත් දෙයකට පෙරලීමෙන් දෙවියන්වහන්සේ තම අභිප්‍රාය ඉටුකරගත් සේක...... පේත්‍රුස් එය මෙසේ පෙන්වයි.

"දෙවියන්වහන්සේගේ නියමවූ මන්ත්‍රණය සහ පෙර දැනගැන්ම ලෙස භාර දෙන ලදුව, නුඹලා ව්‍යවස්ථාව නොසලකන අය ලවා (ක්‍රිස්තුස්වහන්සේ) කුරුසියෙහි ඇනගසා මැරවූවහුය" (ක්‍රියා 2:23)

## මිනිසා පාපයෙන් ගැලවීම.

උන්වහන්සේගේ පුත්‍රයා ඝාතනය කිරීම මගින් මිනිසා දෙවියන්වහන්සේට තම ඉමහත් දුෂ්ඨ භාවය පෙන්වන වේලාවෙහිම, දෙවියන්වහන්සේ මිනිස් වර්ගයා හට පුදුම සහගත ආශිර්වාදයක් ගෙනෙන මාර්ගයක් ලෙස තම පුත්‍රයාගේ මරණය යොදා ගනිමින් මිනිසාට තමන්වහන්සේගේ ඉමහත් යහපත ක්‍රියාකරමින් සිටිසේක.
මෙම ආශිර්වාදයන්ගෙන් පළමුවැන්න උද්දෘදත අපට දෙකක් සිහි ගන්වයි.

"ලියවිලි වල ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණ බව" (1 කොරින්ති 15:3)

“තමන්ම පූජා කිරීම කරණකොට ගෙන පාපය පහකරන පිණිස උන්වහන්සේ කාලයන්ගේ කෙළවරදී එක් වරක් ප්‍රකාශවූ සේක” (හෙබ්‍රෙව් 9:26)

එම නිසා ක්‍රිස්තුස්වහන්සේගේ මරණය, පාපයෙන් මිනිසා ගලවන දෙවියන්වහන්සේගේ මාර්ගය විය.

## මිනිසා මරණයෙන් මුදා ගැනීම

අනෙක් මහා ආශිර්වාදය කුමක්දැයි අපටම ලෙහෙසියෙන් විසඳා ගත හැක. ක්‍රිස්තුස්වහන්සේගේ මරණය මිනිසා පාපයෙන් ගලවාගන්නා නිසා, පාපයේ ප්‍රතිඵලය වූ මරණයෙන් මිනිසා ගලවා ගනී යයිද අප බලාපොරොත්තු විය යුතුය. අපෝස්තුලුවර යොහාන් නිශ්චිතව පවසන්නේ මෙයමයඃ

“මෝසෙස් කාන්තාරයේදී සර්පයා එසවූ ලෙසම මනුෂ්‍ය පුත්‍රයාද උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා සෑම දෙනාම සදාකාල ජීවනය ලබන පිණිසඔසවනු ලබන්ට ඕනෑයයි කී සේක. මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා සෑමදෙනාම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. (යොහාන් 3:14-16)

මෙම උද්ධෘතයේ පළමුවැනි කොටස අප පසුව සාකච්ජා කිරීමට බලාපොරොත්තු වන සිද්ධියකට යොමු වෙයි.නමුත් සක්‍රිය පණිවුඩය තේරුම් ගැනීම පහසුය. ක්‍රිස්තුස්වහන්සේගේ මරණය සදාකල් ජීවත්වීමට අවස්ථාවක් මිනිසාට ප්‍රදානය කරයි.

## සදාකාල ජීවිතය

සදාකාල ජිවිතය වූ දෙවියන්වහන්සේගේ දීමනාවට සම්බන්ධ මූලික කරුණු වචනවලට වඩා පුදුමසහගත වුවද, තේරුම් ගැනීමට අපහසු නැත.

ස්වාමිවූ යේසුස්වහන්සේ ගැන පළමුවෙන් සිතන්න.උන්වහන්සේ මිය ගිය අතර උන්වහන්සේගේ ශරීරය ගුහාවක දමන ලදී. පර්වතයේ හාරන ලද, මිනිසා සෑදූ ගුහාවක්. ඉන් තෙදිනකට පසු ගුහාවේ මුඛයආවරණය කළ මහා ගල අධි මානුෂික බලයකින් ඉවතට පෙරළා තිබුණි, දෙවියන්වහන්සේගේ බලවත් ශක්තියෙන් ක්‍රිස්තුස්වහන්සේ නැගිටුවනු අතර සදාකල් ජීවත් වීමට පිටතට පැමිණී සේක.

1 කොරින්ති 15වේ, ස්වාමින්ගේ නැවත නැගිටීමේ වැදගත් භාවය අවධාරණය කර ඇත. ක්‍රිස්තියානි බලාපොරොත්තුව පාදකව ඇති පදනම් සත්‍යය එයයි.

"නමුත් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිට සිටින සේක්මය. උන්වහන්සේ සැතපී ඉන්නන්ගේ නාඹුල් ඵලයය. මක්නිසාද මනුෂ්‍යයෙකු කරණකොටගෙන මරණය පැමිණුන බැවින් මනුෂ්‍යයකු කරණකොටගෙන මළවුන්ගෙන් නැගිටීමත් පැමිණුනෝය.......නමුත් එක් එක් අය තම තමාගේ ක්‍රමයෙන්ය. ක්‍රිස්තුස්වහන්සේ නාඹුල් ඵලයය. ඉන්පසු, ක්‍රිස්තුස්වහන්සේගේ ඊමේදී උන්වහන්සේ සන්තක වූවෝය. (1 කොරින්ති 15:20-23)

ස්වාමිවූ යේසුස්වහන්සේ ආකාරයෙන්ම උන්වහන්සේගේ අනුගාමිකයෝද මළවුන්ගෙන් නැගිටවනු ලබන්නෝය. උපුටා දක්වනු ලැබූ මෙම කොටස, ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයන්ගේ නැගිටුවීම සිදුවන්නේ උන්වහන්සේ නැවත පැමිණී විට බවද අපට පවසන බැවි අමතක නොකරන්න.

මෙය සම්පූර්ණ කථාව නොවේ. උන්වහන්සේගේ උත්ථානයෙන් පසු ස්වාමිවූ යේසුස්වහන්සේ ජයග්‍රාහිව ප්‍රකාශ කළේ, "මම මරුණෙමි නමුත් බලව මම දැන් ජීවත්ව සිටිමි" (එළිදරව් 1:18) උන්වහන්සේ එතැනින් නැවතුනේ නැත. උන්වහන්සේ තවත් කියන සේක්.... "සදාකාලෙටම ජීවත්ව සිටිමි."

එමනිසා උන්වහන්සේ අයිතිවාසිකම් ද්විත්වයක් කළසේක:
1 උන්වහන්සේ මළවුන්ගෙන් උත්ථානය කළ බවත්, සහ
2 උන්වහන්සේ නැවත මිය නොයන බවත්ය.

"ක්‍රිස්තුස්වහන්සේ තුළ" සිටිනා අය හට එසේ වනු ඇත. ඔවුන්ගේ ස්වාමින් පැමිණෙන විට මළවුන්ගෙන් ඔවුන් නැගිටිනවා පමණක් නොව, "දෙවියන්වහන්සේගේ දීමනාව" වූ සදාකාල ජීවිතයද ඔවුන් හට ලැබෙනු ඇත.

එමනිසා අමරණීයත්වයේ සහ උත්තානයේ ආශිර්වාදයන් ස්වාමින්ගේ අනුගාමිකයන් හට පොරොන්දු වූයේ උන්වහන්සේම දෙවියන්වහන්සේගේ කැමැත්තට යටත්ව කුරුසියක් මත මියගිය නිසාය. ඔවුනට හේතුව බොහෝ ගැඹුරු සහ පුදුම සහගත සම්බන්ධයක් වුවත් කරුණු පැහැදිළිය.

## ආදම්ගේ අනුගාමිකයෝ

මහා පෙරහැරක නායකයා ආදම් ලෙස දැන් සිතන්න. අකීකරුකමේ සහ පාපයේ පුළුල් මාවත දිගේ සෙසු මනුෂ්‍යවර්ගයා ඔහු පසුපස යයි. බොහෝ අය උද්යෝගිමත්ව මෙම ආකර්ෂණීය මාර්ගය දිගේ යන අතර ස්වල්ප දෙනෙක් අකමැත්තෙන් ගමන් කරති. කෙසේ නමුත් වැඩිම දෙනා තමන් උද්යෝගිමත් හෝ අකමැති හෝ අනුගාමිකයන් යැයි නොසිතත්. ඔවුන් ඔහු පසුපස යනවායැයි කිසි විටක අවබෝධ නොකරගෙනය. ඔවුහු සරලව තමනු කැමති දේ කරත්. නමුත් දෙවියන් වහන්සේ සතුටු කිරීමට වඩා තමන් සතුටු කිරීම පාපයකි. එබැවින්, තමන් නොදැනුවත්වම ඔවුන් ආදම්ගේ පෙරහැරේ කොටස්කරුවන්ය.

ඔවුන් ළඟා වෙමින් සිටිනා නොපිළිගන්නා ගමනාන්තය දැකීම අරඹන ලක්ෂයකට ආදම්ගේ අනුගාමිකයන් කිහිපදෙනෙකු පැමිණෙනු ඇත. ඔවුන් ඉදිරියේ මරණය විශාලව පෙනෙනා විට, කිසි ප්‍රයෝජනයක් නොමැතිව ඔවුන් තම දෙපා අදින්නට පටන්ගනී.

ඔවුන් මිය යෑමට අකමැති වුවත්, මරණය ඔවුන් අයත්කරගනී

ස්වාමිවූ යේසුස්වහන්සේ වෙනස් විය. උන්වහන්සේ නිතරම පාපයට විරෝධීවූ අතර මරණය පිළිගත්සේක. එසේ උන්වහන්සේගේ ජීවිතයෙන් සහ මරණයෙන්, ආදම් වැරදි බවත් දෙවියන්වහන්සේ නිවැරදි බවත් උන්වහන්සේ ප්‍රකාශ කළ සේක.

කෙනෙකුගේ පාපයට සාධාරණ දීමනාව ලෙස මරණය පිළිගැනීම ව්‍යාතිරේකයකි. නමුත් කිසි දිනෙක පාප නොකොට මරණය පිළිගැනීම, ස්වාමිවූ යේසුස්වහන්සේ අසමසම පුද්ගලයකු ලෙස වෙන්කර තබයි.

"<u>ක්‍රිස්තුස් යේසුස් නැමති මනුෂ්‍යයා</u>"

යේසුස්වහන්සේට අපට වඩා හාත්පසින්ම උසස් ස්වභාවයක් තිබුනා නම්, මෙම පාඩම එතරම් වමත්කාර නොවනවා ඇත. නමුත් ශුද්ධ ලියවිලි උන්වහන්සේට අප හා සමානම ස්වභාවයක් තිබුන බැව් සහතික කරයි. වැරදි අවබෝධයක් ලැබීම පහසු නිසා සරල භාෂාවෙන් යථාර්තය ඉදිරිපත් කරමු.

ස්වාමිවූ යේසුස්වහන්සේට මනුෂ්‍යය පියෙක් නොසිටි සේක. දෙවියන්වහන්සේ ඇත්තටම උන්වහන්සේගේ පියාණන් වූ නිසා උන්වහන්සේට දෙවියන්වහන්සේගේ පුත්‍රයා යැයි කී සේක. ශුද්ධාත්මය යැයි හැඳින්වූ දෙවියන්වහන්සේගේ බලය මිනිස්වාර්ගික සාමාජිකාවක් වූ උන්වහන්සේගේ මව පිළිසිඳ ගන්වා පුත්‍රයෙකු - දෙවියන්වහන්සේගේ පුත්‍රයා - බිහි කරන්නට සැලැස්විය.

"දේවදූතයා ඇට උත්තර දෙමින්ඃ ශුද්ධාත්මයාණන් වහන්සේ නුඹ කෙරෙහි පැමිණෙන සේක. මහෝත්තමයාණන්ගේ

ආනුභාවයෙන්ද නුඹ වසාගන්නේය. ඒ නිසා උපදින්නට සිටින තැනැත්තේ ශුද්ධය, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයයි කියනු ලබන සේක." (ලූක් 1:35)

## "උන්වහන්සේගේ සහෝදරයන්ට සමානව"

දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැන් අමරණීයය (උන්වහන්සේගේ උත්තානයෙන් පසු "දිව්‍යමය ස්වභාවය" ලබාගති) නමුත් උන්වහන්සේගේ පැවැත්මේ පළමුවැනි අදියරේදී උන්වහන්සේ අපගේ මනුෂ්‍ය ස්වභාවය භුක්ති වින්ද සේක.

"එහෙයින් දරුවන් ලේ හා මංශයට පංගුකාරයන්ව සිටින නිසා උන්වහන්සේ එම ආකාරයෙන් ඒවාට පංගුකාරයෙක් වූ සේක. එසේ කළේ මරණය කෙරෙහි බලය ඇත්තා වන යක්ෂයාව මරණය කරණකොටගෙන බල නැතිකොට ........ සැබවින් උන්වහන්සේ අල්ලාගත්තේ දේවදූතයන් නොව ආබ්‍රහම්ගේ වංශයයි. එබැවින් සෙනඟගේ පව් උදෙසා ශාන්ති පූජාවක් ඔප්පු කිරීමට දෙවියන්වහන්සේ පිළිබඳ කාරණා ගැන දයාවන්තවූ විශ්වාස වූ උත්තම පූජකයෙක් වෙන පිණිස, සියලු දෙයින්ම තමන්ගේ සහෝදරයන්ට සමාන වෙන්නට උන්වහන්සේට යුතු වූයේය. මක්නිසාද උන්වහන්සේම පරීක්ෂාකරනු ලැබ දුක්වින්ද බැවින්, පරීක්ෂා කරනු ලබන්නන්ට පිහිටවෙන්ටඋන්වහන්සේට පුළුවන". (හේබ්‍රෙව් 2:14-18)

"මක්නිසාද අපට සිටින්නේ අපේ දුර්වලකම් වලදී අපේ දුක නොදැනෙන උත්තම පූජකයෙක් නොව පව් කිරීමක් නැතුව, සියලු ආකාරයෙන්මඅපවාගේ පරීක්ෂා කරනු ලැබූ උත්තම පූජකයෙක්ය". (හේබ්‍රෙව් 4:15)

මෙම සත්‍යය මත ශුද්ධ ලියවිල්ල එතරම් අවධාරණය තබන්නේ එහි වැදගත්කමේ පිම්මක් ලෙසිනි. "උන්වහන්සේගේ මාංශමය දවස්වල" අපගේ ස්වාමින් හට අපමෙන් ස්වභාවයක් තිබූ බව පවසන බයිබල් උගැන්වීම් බොහෝ අය කෝපයෙන් ප්‍රතික්ෂේප කිරීම පුදුම සහගතය. වනාන්තරයේදී උන්වහන්සේ පරීක්ෂාවට ලක්වීම රංගනයක් නොවේ. එය සත්‍යයකි. එම යෝජනා ආකර්ෂණීය විය. ඒවා මැඩ පැවැත්වීමට උන්වහන්සේට අරගල කිරීමට සිදුවිය. මරණය පිළිගැනීමේ අරගලයද එසේම විය.

නමුත් පාපයට විරෝධය පෑමෙන් සහ මරණය පිළිගැනීමෙන්, ස්වාමිවූ යේසුස්වහන්සේ ආදම් ප්‍රතික්ෂේප කර මෙම මහා විවාදයේදී දෙවියන්වහන්සේගේ පක්ෂයට තීරණාත්මකව පහත් විය.

## ක්‍රිස්තුස්වහන්සේ විසින් පාපය යටත්කර ගැනීම

උන්වහන්සේගේ ජීවිතයේදී සහ මරණයේදී උන්වහන්සේ තම පියාණන් ගෞරවයට පාත්‍රකළ අතර උන්වහන්සේ (ආදම් නොව) ධර්මිෂ්ඨ බැව් ප්‍රකාශ කළ සේක. එමනිසා උන්වහන්සේගේ චරිතය උන්වහන්සේගේ පියාණන්ගේ කැමැත්තට පූර්ණ අනුකූලතාවයෙන් යුක්ත විය. සැබෑ පුත්‍රයෙකු සේ උන්වහන්සේ දෙවියන්වහන්සේට ගෞරව දැක්විය. උන්වහන්සේ මළවුන්ගෙන් උත්ථාන කිරීමෙන් සහ අමරණීයත්වය දීමෙන් දෙවියන්වහන්සේ උන්වහන්සේට ගෞරව දැක්විය.

දැන් තවත් පෙරහැරක නායකයා ස්වාමිවූ යේසුස්වහන්සේ ලෙස සිතන්න - තරමක කුඩා පෙරහැරකි - උන්වහන්සේ ගෝලයන්ට මෙසේ කිය "යමෙක් මා පස්සේ එන්නට කැමති නම් ඔහු තමාව නොසලකා තමාගේ කුරුසිය රැගෙන මා සමග ඒවා" (මතෙව් 16:24)

ඔබට චිත්‍රය පැහැදිලිද? කුරුසිගත කරන ස්ථානයට යන්නන් ඉදිරියේම යේසුස්වහන්සේය. උන්වහන්සේගේ පසුපස ආදම්ගේ පෙරහැර අත්හැරීමට කැමති වූ මිනිසුන්ගේ පෙරහැරක්. සැම කෙනාම කුරුසියක බරින් යටත්ව නැම්, සැම කෙනාම ස්වෙච්ඡාවෙන් කුරුසිගත වීමට ඔවුන්ගේ නායකයා ලෙසම ඔවුන්ද දෙවියන්වහන්සේ නිවැරදි බැව් තීරණය කර ඇත. උන්වහන්සේ සමඟ ජීවත්වන පිණිස, ක්‍රිස්තුස්වහන්සේ සමග මිය යාමට ඔවුහු යන්නෝය.

<u>බෞතීස්මය - ක්‍රිස්තුස්වහන්සේ සමග භූමදානය</u>

ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයන් වීමට තීරණය කළ බැව් මිනිසුන් පෙන්වන්නේ බෞතිස්මයෙන්ය. මෙය රෝම 6 පරිච්ඡේදයේ වාර්ථාවේ. "එසේවී නම් කුමක් කියමුද? අනුග්‍රහය බොහෝ වන පිණිස පාපයෙහි පවතිමුද? එසේ නොවේවා. පාපයට මළාවූ අපි තවත් එහි කෙසේ ජීවත් වෙමුද? නොහොත් ක්‍රිස්තුස්වහන්සේ තුළට බෞතිස්ම ලැබූවාවූ අප සියල්ලන් උන්වහන්සේගේ මරණයට බෞතිස්ම ලැබූ බව නුඹලා නොදැන සිටියහුද? එබැවින් ක්‍රිස්තුස්වහන්සේ පියාණන්ගේ මහිමය කරණකොටගෙන මළවුන් ගෙන් නැගිටුවනු ලැබුවා සේම, අපිත් ජීවිතයේ අලුත්කමෙන් හැසිරෙන පිණිස, මරණය තුලට බෞතිස්මය කරණකොට ගෙන උන්වහන්සේ සමග තැන්පත් කරනු ලැබුවෙමුව. මක්නිසාද, උන්වහන්සේගේ මරණයේ සමානත්වයෙන් අපි උන්වහන්සේට සම්බන්ධවී සිටිමු නම්, උන්වහන්සේගේ නැගිටීමේ සමානත්වයෙනුත් සම්බන්ධ වන්නෙමුව. මින්මතු අපි පාපයට සේවය නොකරන ලෙස පාප ශරීරය නැතිවන පිණිස, අපේ පරණ මනුෂ්‍යයා උන්වහන්සේ සමග කුරුසියෙහි ඇණගසන ලද බව දනිමුව" (රෝම 6: 1-6)

බෞතිස්මය තුළින් අදහාගන්නෙක් ස්වාමිවූ යේසුස්වහන්සේ සමග එකතු වන්නේ කෙසේ දැයි බලන්න.

උන්වහන්සේ සමග ඔහු මිය යයි. පරිච්ඡේදයේ රූපමය භාෂාවෙන්, ඔහු උන්වහන්සේ සමඟ කුරුසිගත කරයි. ඔහු පාපයට කුරුසිගත කොට ඇත - ඔහු තම පෙර ජීවිත මාර්ගය ඉවතලයි - බෞතිස්මයට පසු ඔහු ගෙවන දිවිය, උත්ථානය වූ ක්‍රිස්තුස්වහන්සේ මෙන් නව ජීවිතයකි.

## පැති වෙනස් කිරීම.

කලින් ඉදිරිපත් කරන ලද අවසානයක් සිහියට ගනිමින් ලෝකයට අයත්වන්නාවූ සියල්ලෝ ක්‍රිස්තුස්වහන්සේ කුරුසිගත කළ අයහට අයත්ය බෞතිස්මය ලද අදහන්නන් ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසිගතවූ බැව් අපි මේ දැන් දුටුවෙමු. එම නිසා එම අය පැති වෙනස්කර තිබේ. කුරුසිගත කරන්නෝ දැන් කුරුසිගත වන්නෝ මෙන්, පීඩා කරන්නෝ පීඩා ලබන්නෝය.

මෙම වෙනස, ටාසර්ස්හි සාවුල් යයි ඔවුන් හැඳින්වූ පුද්ගලයාට අනපේක්ෂිතව සිදු විය. "ස්වාමින්වහන්සේගේ ගෝලයන්ට විරුද්ධව තර්ජනය කරමින්ද, ඔවුන් මරමියි කියමින්ද" (ක්‍රියා 9:1) සිටි කාලයක් ඔහුට විය. යේසුස්වහන්සේ තම ගෝලයන් සමග කොතරම් දැඩි අනන්‍යතාවයක් පැවැත්වූයේද යත්, උන්වහන්සේ මැදිහත්වී සාවුල්ට දෝශාරෝපණය කරමින්, "සාවුල්, සාවුල් නුඹ මට පීඩා කරන්නේ මක්නිසාද?" යැයි ඇසූ සේක. සාවුල්ගේ විමසුමට ප්‍රතිචාරයක් වශයෙන් ස්වාමින් : "මම වනාහි නුඹ පීඩා කරන යේසුස්" යැයි පැවසීය. (ක්‍රියා 9:4-5)

සාවුල් පරිවර්තනය වූවාට පසු, ඔහු පීඩා විඳීමට අවශ්‍ය විය. උන්වහන්සේ පැවසුවේ : "ඔහු මාගේ නාමය නිසා කොපමණ දේ විඳින්නට ඕනෑද කියා ඔහුට දන්වන්නෙමි" (ක්‍රියා 9:16) ඔහු කොතරම් වේදනා වින්දේද !

## ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසිගතවී

පසුව සාවුල් (පාවුල් ලෙස නම වෙනස් කරන ලදුව) ගලාතිවරුන්ට මෙසේ ලිවේය.

"මම ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි. එසේ වී නමුත් මම ජීවත් වෙමි, නමුත් තවත් මා නොව ක්‍රිස්තුස්වහන්සේ මා තුළ ජීවත් වන සේක. තවද මා දැන් මංශයේ ජීවත්වන ජීවිතය මට ප්‍රේම කළාවූ මා උදෙසා තමන්ම පාවා දුන්නාවූ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වෙමි." (2:20)

ගලාතිවරුන්ට ලියන ලද ලිපියේ තවත් කොටසකින් මෙම විෂයයට තවත් ආලෝකය වැටෙයි.:

"නමුත් අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය ගැන මිස වෙන කිසි දෙයක් ගැන පාරට්ටු කරන්නට මට නම් සිද්ධ නොවේවා, ඒ කරණකොටගෙන ලෝකය මටද මා ලෝකයටද කුරුසියෙහි ඇණගසනු ලද්දේ විය." (6:14)

පාවුල් කුරුසිගත කිරීම් දෙකක් සමග මෙතැන සම්බන්ධය "(1)......ලෝකය මටද........(2)............මා ලෝකයටද කුරුසියේ ඇණ ගසනු ලද්දේ විය" දෙවැනි කුරුසිගත කිරීම තේරුම් ගැනීමට පහසුය. පාවුල් ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයකු බැවින් විරුද්ධ ලෝකය විසින් (රූපමය වශයෙන්) කුරුසිගත කොට ඇත. නමුත් පළමුවැනි කුරුසිගතවීම ගැන කුමක්ද? පාවුල් - සහ අනෙත් අදහන්නන් - ලෝකය කුරුසිගත කරන්නාවූන්ය. මෙය කෙසේ සිදුවන්නේද?

පිළිතුර නම්, ලෝකය අපට බාහිරව සහ අප අවට ඇති නමුත්, අප සැමදෙනා තුළම ලෝකය ඇත.

මනුෂ්‍යය ආශාවන් ලෝකය යනුවෙන් හඳුන්වනු ලැබේ. (1 යොහාන් 2:16) "මාංශය" යැයිද හඳුන්වන අප තුළ ඇති මෙම ලෝකය, කුරුසිගත කළ යුතුය. එම නිසා ගලාති 5:24 පාවුල් මෙසේ පවසයිඃ

"ක්‍රිස්තුස්වහන්සේට අයිති තැනැත්තෝ මාංසය එහි ආශා සහ තෘෂ්ණා සමග කුරුසියේදී ඇණ ගැසුවෝය"

එම නිසා ගෝලයෝ, පෙරමුණු දෙකකින් ලෝකයට මුහුණදීමට සූදානම් විය යුතුයි. ඔවුන්ගේ අදේව නැඹුරුවන් කුරුසිගත හෝ විනාශ කළ යුතුය. තවද ඔවුන් පාපයට වෛර කරන බැවින්, ඔවුන්ට වෛර කරන ලෝකයේ පීඩාවන් විඳදරා ගත යුතුය. ලෝකයේ විරුද්ධතාවය නොයෙක් ආකාරයකින් තමන් පෙන්වයි. සමහර විට එය ශාරීරික ප්‍රහාර ලෙස වෙස් ගැනේ, සමහර විට එය නින්දිත පීඩාය. නිත්‍යව සැබෑ ක්‍රිස්තියානින් සමඟ සමාගමය ලෝකයේ ජනතාව අගේ නොකරන බවට ඇඟවීම් ඇත.

## ආදේශකයෝ නොව - නියෝජිතයෝ

ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා මිය යාමේ යථය අලුත් ගිවිසුම් ඉගැන්වීම් වල වැදගත් කොටසකි. නමුත් එක් දෙයක් අපි පැහැදිලි කර ගනිමු. ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා මිය ගියත්, උන්වහන්සේ අප වෙනුවෙන් (ආදේශයක් ලෙස) මිය නොගිය සේක. අප දුටු පරිදි , ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයෝ උන්වහන්සේ සමඟ මිය යා යුතුය. බෞතිස්මයේ අරුත මෙයයි. ".....අපේ පරණ මනුෂ්‍යයා උන්වහන්සේ සමඟ කුරුසියෙහි ඇණගසන ලද බව දනිමුව" (රෝම 6:6)

ඒදනයේදී මනුෂ්‍ය වර්ගයා මත දෙවියන්වහන්සේ මරණ දඬුවම නියම කළ වේලේ, උන්වහන්සේ තමන්වහන්සේගේම

ධර්මිෂ්ඨ ව්‍යවස්ථා අනුමත කළේය. උන්වහන්සේ මෙම තීන්දුව වෙනස් කළේ නම්, පාපය ඇත්තටම එතරම් වැදගත් නොවන බව ප්‍රකාශ කිරීමක් වන්නේය. එම නිසා ඒ දිනයේ තීන්දුව පවතින අතර අප එකිනෙකා මිය යා යුතු බැවි දෙවියන්වහන්සේ අපේක්ෂා කරන සේක.

ඉක්මනින් හෝ පසුව මරණය සියලු මනුෂ්‍යයන් පසුකර යනවා ඇත : නමුත් දෙවියන්වහන්සේ අපගේ අවමාන සහ බලාපොරොත්තුවෙන් තොර තත්වය හඳුනාගෙන මරණීය දණ්ඩනය <u>අපේක්ෂාවෙන්</u> බලා සිටින්නට ධෛර්යය ගැනීමට උනන්දු කරන සේක. කුරුසිගත කිරීමට අපි ස්වෙච්ඡාවෙන් යා යුතු වෙමු.

දැන් ක්‍රිස්තුස්වහන්සේ ගැන සිතන්න. උන්වහන්සේ වේදනාවෙන්, පරීක්ෂාවෙන්, මැරෙනසුළු බවෙන් මිනිස් වර්ගයා සමඟ අනන්‍යවූ අපගේ නියෝජිතයාණෝය. උන්වහන්සේ කිසිදා පාපයක් නොළඳ, අනෙක් අයගේ පාපයේ මහා බර ඔවුන්ගේ වේදනාකාරී සහ නින්දාශීලි ප්‍රතිවිපාකයන් සමඟ ඉසිලිය.

දිවැසිවර යෙසායා, එය මෙසේ ප්‍රකාශ කරයි:

"උන්වහන්සේ තුවාල ලැබූයේ අපේ අපරාධ නිසාය. පොඩි කරනු ලැබූයේ අපේ අයුතුකම් නිසාය. අපට සමාදානය ගෙන දෙන දඬුවම උන්වහන්සේ පිටට පැමිණියේය. උන්වහන්සේගේ පහර වලින් අපට සුවය ලැබී තිබේ. අපි සියල්ලෝම බැටළුවන් මෙන් මුලාවී, එකිනෙකා තම තමාගේම මාර්ගයට හැරී ගියෙමුව. ස්වාමින්වහන්සේද අපි සියල්ලන්ගේ අයුතුකම උන්වහන්සේ පිට තැබූ සේක. උන්වහන්සේට පීඩා කළ විට, උන්වහන්සේ යටත් වී තමන්ගේ මුඛය නැර සිටිසේක. මරණ්නට ගෙනයන බැටළු පැටවකු මෙන්ද, බැටළු දෙනක් ලෝම කපන්නන් ඉදිරියේ නිශ්ශබ්දව සිටින්නාක් මෙන් උන්වහන්සේ මුඛය නැර සිටිසේක." (යෙසායා 53:5-7)

සමහර විට අසන ප්‍රශ්නයක් නම්: එතරම් වේදනාත්මක සහ නින්දාසහගත මරණයක් යේසුස්වහන්සේ ලැබුවේ ඇයි?එක් කරුණක් නම් උන්වහන්සේ අනෙක් අයගේ පාප ඉසිලිමයි: උන්වහන්සේ සමඟ අනන්‍යවූ සියලුදෙනාගේම පාප උන්වහන්සේ දැරිය. වේදනාව සහ කුරුසියේ නින්දාව ඔවුන්ගේ ක්‍රියාවල සාධාරණ දීමනාය. පසුතැවුනු සොරා තමා කුරුසිගත වීම සුදුසු යැයි හඳුනාගත්තේය. (ලූක් 23:40-41) සියලු සැබෑ ක්‍රිස්තියානින් එසේ විය යුතුය. කුරුසිගත වීමෙන් අපගේ ස්වාමීන් මනුෂ්‍ය ස්වභාවයට සුදුසු කුමක් දැයි ප්‍රචාරය කළ සේක.

ක්‍රිස්තුස්වහන්සේ අපගේ නියෝජිතයාණෝය. ජීවිතයේදීත් මරණයේදීත්, උන්වහන්සේ මනුෂ්‍යය ස්වභාවය සමඟ අනන්‍ය වූ සේක. අපිද උන්වහන්සේ සමඟ අනන්‍ය විය යුතුවෙමු. අප උන්වහන්සේ සමඟ මිය යා යුතුය. උන්වහන්සේ සමඟ, මරණයට බලය නොමැති ජීවිතයකට නැගිටවනු ලැබිය යුතුය.

“මෙය විශ්වාස වූ කීමක්ය: අපි උන්වහන්සේ සමඟ මැරුණොමු නම් උන්වහන්සේ සමඟ ජීවත් වන්නෙමුව. අපි ඉවසමු නම් උන්වහන්සේ සමඟ රජකම් කරන්නෙමුව. අපි උන්වහන්සේ නාඳුනමුය කියමු නම්, උන්වහන්සේත්: නුඹලා නාඳුනමියි කියන සේක.” (2 තිමෝති 2:11-12)

## <u>පිත්තල සර්පයා .......... දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණෝ</u>

යොහාන්ගේ සුභාරංචියේ ස්වාමිවූ යේසුස්වහන්සේ බැටළු පැටවකු ලෙසින් විස්තර කර ඇත. “අන්න ලෝකයේ පාපය දුරු කරන දෙවියන්වහන්සේග් බැටළු පැටවානෝ” (යොහන් 1:29) එම සුභාරංචියේම ස්වාමිවූ යේසුස්වහන්සේ තමන්වහන්සේ පිත්තල සර්පයෙකුට සමාන කරණු ලබත්: “මෝසෙස් කාන්තාරයේදී සර්පයා එසවූ ලෙසම මනුෂ්‍ය පුත්‍රයාද.........ඔසවනු ලබන්නට ඕනෑය.” (යොහන් 3:14)

සිතාගත නොහැකි තරමේ මහා වෙනස්කමකි. බැටළු පැටවුන් ලක්ෂණ, අහිංසක සහ ඉතා වටිනා උන්ය. සර්පයෝ පිළිකුල් සහගතය. විෂ සහ අනතුරුදායකය. අපගේ ස්වාමීන් තමන්වහන්සේ පිත්තල සර්පයෙකුට සමාන කර නොගත්තේ නම්, අප කිසි කලෙක එසේ කරන්නට එඩිතර නොවන්නේමු. <u>උන්වහන්සේගේ මරණයේදී</u> ස්වාමිවූ යේසුස්වහන්සේගේ සංකේත ලෙස බැටළු පැටවෙකු සහ සර්පයකු යන සතුන් දෙදෙනා යොදාගැන්ම අපූර්වය. තේරුම් ගැනීමට සත්‍යයක් මෙතැන තිබෙන බව පිළිගැනීමට මෙය අපට උදව් විය හැක. මෙම සමාන කිරීම-නපුරට විශාල හැකියාවක් ඇති සත්වයකුගේ අහිංසක මූර්තියක් වූ - <u>පිත්තල</u> සර්පයෙකු සමඟ බැව් අමතක නොකරන්න. පිත්තල සර්පයාගේ කථාව ගණන් කථාව 21 පරිච්ඡේදයේ කියා ඇත. දෙවියන්වහන්සේගේ යහපත් දීමනා ගැන නිතර මැසිවිලි කීමෙන් ඊශ්‍රායෙල් ජනතාව තමන් මත දෙවියන්වහන්සේගේ කෝපය ගෙනමින් තිබුණි. දෙවියන් වහන්සේ ඔවුනතරට ගිනි සර්පයෝ එවූ අතර, බොහෝ අය දණ්ඩ කරන ලදුව මරණීය තුවාල ලදහ. ඊට පසු අනුකම්පාවෙන්, පිත්තල සර්පයකු තනන්නටත්, එය දණ්ඩක් මුදුනේ පහර කැ ජනතාව මධ්‍යයේ තබන්නටත් දෙවියන් වහන්සේ මොසෙස්ට අණ කළ සේක. උවමනාවෙන්ම එම පිත්තල සර්පයා දෙස හැරී බැලූ මිය යමින් සිටි ඊශ්‍රායලිතයෝ සුවවූහ.

## <u>මොසෙස්ගේ ව්‍යවස්ථාවට ගැළවීමට නොහැකි විය.</u>

මෙම සත්‍යය කථාවේ වැදගත් පාඩම් ඇත. පළමුව ජනතාව මරණින් බේරා ගැනීමට මෝසෙස්ගේ ව්‍යවස්ථාවේ ඇති වැදගත්කම එය පැහැදිලි කරයි. මෙම විනාශකාරී තත්වයට මුහුණ දීමට ව්‍යවස්ථාවට කිසිත් නොතිබුනි. අප බලාපොරොත්තු විය යුතු පරිදි, දෙවියන්වහන්සේ දෙන ලද මොසෙස්ගේ ව්‍යවස්ථාව සාධාරණ සහ නැනවත් නිති පද්ධතියක් විය. නිතිය පැවැත්වූ අයහට අනගි ආශිර්වාද පොරොන්දුවෙන ලදී.

ගැටළුව වූයේ ව්‍යවස්ථාවේ සාධාරණ ඉල්ලීම් ඉටු කිරීමට මිනිසා යහපත් නොවීමයි.

"කුමක් හෙයින්ද ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් කිසිම මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේ ඉදිරියේ ධර්මිෂ්ඨ කරනු නොලබන්නේය. මක්නිසාද ව්‍යවස්ථාව කරණකොට ගෙන පාපය දැන ගැනීම වේ." (රෝම 3:20)

නමුත් මොසෙස්ගේ ව්‍යවස්ථාවේ වතාවත් සහ නියෝග බොහෝ උපදේශාත්මක විය. ව්‍යවස්ථාව ඇත්තවශයෙන්ම පිළිබිඹු කළේ දෙවියන්වහන්සේගේ ප්‍රේමයත් මිනිසා ගැන සැලකිල්ලත්ය. එය "අපි ඇදහිල්ල කරණකොටගෙන ධර්මිෂ්ඨකරනු ලබන පිණිස, ව්‍යවස්ථාව අප ක්‍රිස්තුස්වහන්සේ ළඟට පමුණුවන අපේ ගුරුවරයෙකි." (ගලාති 3:24) උන්වහන්සේගේ ආදරණීය පුත්‍රයාගේ මරණය තුළින් දෙවියන් වහන්සේගේ වන්දිගෙවීමේ ක්‍රියාව තේරුම් ගැනීමට ව්‍යවස්ථාව විචක්ෂණ ඊශ්‍රායලිතයා - සහ අපගේ දැන ගැනීමට උදව් වශයෙන් සූදානම් කළේය.

## <u>විශ්වාසය, අනුග්‍රහය....... සහ දෙවියන්වහන්සේගේ ප්‍රේමය</u>

තමන් මරණයට සුදුසු පව්කාරයන් යන යථය පිළිගන්නා තුරු කෙනෙකුට ගැළවීම ලබාගත නොහැක. නමුත් තමන්ගේ දුඃඛිත භාවයට සංවේදී අය සඳහා මෙම වචන අදාලය:

" නමුත් දැන් වනාහි ව්‍යවස්ථාව නැතුව, ව්‍යවස්ථාව සහ අනාගතවක්තෘවරුන්ගෙන් සාක්ෂි ලබමින්, දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකමක් ප්‍රකාශ කරන ලද්දේය. එනම් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණකොට ගෙන, අදහන්නාවූ සියල්ලන්ට ලැබෙන ධර්මිෂ්ඨකමය. ප්‍රභේදයකුත් නැත, මක්නිසාද සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති.

එබැවින් ඔවුහු උන්වහන්සේගේ අනුග්‍රහයෙන් ක්‍රිස්තුස්යේසුස්වහන්සේ තුල තිබෙන මිදීම කරණ කොටගෙන නොමිලයේ ධර්මිෂ්ඨ කරනු ලබන්නෝ වෙති." (රෝම 3:21-24)

පාපය නමැති සර්ප දෂ්ඨයෙන් මනුෂ්‍යය වර්ගයා ගැලවීමට මෝසෙස්ගේ ව්‍යවස්ථාව තුළ බලයක් නොතිබුනු බැව් පෙන්වීමට පිත්තල සර්පයාගේ සිද්ධිය නාට්‍යානුසාර උපමාවකි. දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ ඒක ජාතක පුත්‍රයා සැපයූයේ එබැවිනි.

නමුත් සියලු සත්වයන් අතුරින් ස්වාමින්වහන්සේ තමන්වහන්සේ සර්පයෙකුට සමාන කරන්නේ ඇයි? දේව පුත්‍රයා පැමිණියේ මනුෂ්‍යය වේශයෙනි. චරිතය අතින් උන්වහන්සේ පූර්ණ වුවත්, උන්වහන්සේ ආදම්ගෙන් "සර්ප" ස්වභාවයක් උරුමකර ගෙන තිබුණි. එනම් පාපයට පොළඹවන්නට හැකි ස්වභාවයක්: ගැටළුවට හේතුව වූයේ මෙම ස්වභාවයයි. එය ශාප කර කුරුසිගත කිරීමට උවමනා විය.

කෙනෙකු ගසක, දණ්ඩක හෝ කුරුසියක එල්ලීම සංකේතාත්මක ක්‍රියාවක් විය."ඔසවනු ලද්දාවූ" තැනත්තන් හට ශාප කිරීමේ හේබ්‍රෑව් ක්‍රමය එය විය. ශුද්ධ ලියවිලි වචන වල: "එල්වනු ලබන තැනැත්තේ දෙවියන්වහන්සේගෙන් ශාප ලද්දෙක්ය" (ද්විතිය කථාව 21:23) දණඩේවූ සර්පයා සමඟ තමන්වහන්සේ සමාන කර ගනිමින්, දෙවියන්වහන්සේගේ ආධිපත්‍යයට විරුද්ධව කැරලිගැසීමේ ප්‍රවනතාවය උරුම මනුෂ්‍ය ස්වභාවයට ශාප කිරීම සහ විනාශ කිරීම තුළින් පමණක් මරණයෙන් ගැළවීම ලබාගත හැකි බැව් ස්වාමීන් උගැන්වූ සේක. මෙම කැරලිකාර ස්වභාවය දැරූ අහිංසකයෙකු වූ ස්වාමිවූ යේසුස්වහන්සේ, එයට කළ යුත්තේ කුමක්දැයි පෙන්වූ සේක.

උන්වහන්සේ එය කුරුසිගත කළ අතර, අනෙක් අයටද එසේ කරන්නටැයි ආරාධනා කළහ.

## <u>පාස්කු</u>

"බැටළු පැටවා" අපගේ සිතුවිලි පැරණි ගිවිසුම දක්වා රැගෙන යන්නාවූ තවත් සංකේතයක්ය. මිසරයේ පාස්කුව, <u>ජාතියක් වශයෙන්</u> ඊශ්‍රායල් ඉතිහාසයේ ආරම්භය විය. පළමුව ඒ වසංගත මාලාව පැමිණි අතර මිසරයේ සෑම කුළුඳුලාගේම මරණයෙන් එය අවසන් විය. ඊශ්‍රායල් සඳහා ස්වයංක්‍රිය මුක්තියක් නොතිබුණි. නොකැලැල් පිරිමි බැටළු පැටවෙකු මරා, උගේ මාංශය අනුභව කොට, එම රුධිරය තමන්ගේ නිවසෙහි කවුළු සහ දොර උළුවහු වල ඉසින්නට ඔවුන්ට නියම විය. මෙය කළහොත් පමණක් මිසරවරුන් විනාශවන විට තමන්ගේ කුළුඳුලන් බේරුනි. (නික්මයාම 12 බලන්න.)

මෙම විස්මිත බල ප්‍රදර්ශණයේ - විනාශ කිරීමට බලයත් ගලවා ගැනීමට බලයත් - අවසන් ප්‍රතිඵලය වූයේ මිසර වහල් භාවයෙන් මුළු ජාතියම නිදහස් කර ගැනීමයි. ඊශ්‍රායල් ජනතාව හට මෙම බලසම්පන්න නිදහස අමතක නොවීමට සහතිකයක් වශයෙන්, මෙම පාස්කුව වාර්ශිකව සමරන්නට දෙවියන්වහන්සේ අණ කළ සේක. සෑම පවුලක්ම තමන්ට බැටළු පැටවෙකු හිමිකර ගත් අතර, මිසරයෙන් නිදහස් වීමේ පැහැදිලි මතකයක් සැපයීම වශයෙන් ඌ මරා උගේ මස් අනුභව කළේය. තවමත් නූපන් පරම්පරා ගණනාවක් එම තීරණාත්මක රාත්‍රිය සඳහා දෙවියන්වහන්සේට ස්තූති කිරීමට හේතු ලබාගන්නවා ඇත.

නව ගිවිසුම් යුගයේ යුදෙව්වරු මෙම වාර්ෂික පාස්කු උත්සවය පැවැත්වීමට ප්‍රවේසම් වූහ. කිසිදෙයක් අතපසු නොකරන ලදී. ඇත්තවශයෙන්ම ඔවුන් උවමනාවටත් වැඩියෙන්

කළහ. නමුත් ඔවුන්ගේ හදවත් තුළ කෘතඥතාවය නොතිබුනි. මෙම උත්සවය පැවැත්වීමට පූජකවරුන් සහ පාලකයන් සංකීර්ණ පිළියෙල කිරීම් කරණ විටම - බලසම්පන්න මුදාගැනීමක් සඳහා තම කෘතඥතාවය පෙන්වීමට සැලසුම් වූ උත්සවයක් - ඔවුන් දෙවියන්වහන්සේගේ එකම පුත්‍රයා ඝාතනය කිරීමට කුමන්ත්‍රණය කරමින් සිටියහ.

## වඩා බලවත් නිදහසක්

නමුත් දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ සැලසුම්ද කරමින් සිටිසේක. තමන් නොදැනුවත්වම මෙම කුමන්ත්‍රණකාරී පූජකවරු, ලෝකයේ පාපය රැගෙන යන්නාවූ දෙවියන් වහන්සේගේ බැටළු පැටවානෝ වන මහා බලවත් බැටළු පැටවෙක් පූජාකිරීමට සැලසුම් සාදමින් සිටියහ. උන්වහන්සේගේ මරණය, මිසරයේ වහල්භාවයට වඩා ඛේදජනක ඉරණමකින් - පාපයේ සහ මරණයේ වහල් භාවයෙන් - නිදහස සපයනු ඇත.

බැටළු පැටවාගේ පාඩම කුමක්ද? එය නියෝජනය කරන්නේ මිනිසාට දැරිය හැකි සුපිරිසිදු සහ වටිනාම විශිෂ්ට දෙයකි. මෙම විශිෂ්ටය දෙවියන්වහන්සේට ඔප්පු කරනු ලබයි. සැබෑ යහපත් සෑම දෙයක්ම දෙවියන්වහ්නසේගෙන් පැමිණෙන අතර දෙවියන් වහන්සේට අයත්ය. තමන් තුළ ඇති වටිනාම දේ, තමන් සතු ඇති වටිනාම දේ, සහ සියල්ලටම වඩා ජීවිතයද දෙවියන්වහන්සේට ඔප්පු කිරීමට මිනිසුන්ගෙන් ඉල්ලනු ලබත්. පාස්කු බැටළු පැටවා ඔප්පු කරනු ලැබුවේ ඔප්පු කරන්නා වෙනුවට නොවේ. එය ඔහුගේ විශ්ෂ්ටය නියෝජනය කළ අතර දෙවියන්වහන්සේ හට තම පූර්ණ යටත්වීමේ සංකේතයක් විය. බැටළු පැටවාගේ මස් අනුභව කිරීමෙන්, ඊශ්‍රායලිතයෝ සංකේතාත්මකව ඌ සමඟ අනන්‍ය වූහ. උගේ රුධිරය අර්ථයෙන් තමන්ගෙන් රුධිරය වූ අතර එහි අරුත වූයේ, උගේ ජීවිතය තම ජීවිතය නියෝජනය කළ බවයි. මෙම උත්සවය

මගින් ඔවුන් තමන්ගේ නොවන බැව් ඔවුහු ප්‍රකාශ කළහ. ඔවුහු තමන් දෙවියන්වහන්සේට පූජා කළහ. දෙවියන්වහන්සේ ඔවුන් තමන්වහන්සේගේ බැව් හඳුනාගත් අතර ඔවුන් ගලවා ගත් සේක.

දෙවියන්වහන්සේගේ බැටළුපැටවාණන් ගැනත් එසේමය. උදව් අවශ්‍ය බැව් අවබෝධයෙන්, උන්වහන්සේ තම පියාණන්ගෙන් එය කැපවීමෙන් සෙවීය. උන්වහන්සේට එය හමුවිය. උන්වහන්සේගේ සියලු ගුණයයන් සහ චරිතයේ පූර්ණ භාවය දෙවියන්වහන්සේගෙන් ලැබී තිබුනු අතර ඒවා දෙවියන්වහන්සේට ඔප්පු කරනු ලැබින. උන්වහන්සේගේ පූර්ණභාවය අගේ කරන්නටත්, උන්වහන්සේ සමඟ අනන්‍යවන්නටත්, උන්වහන්සේ තුළින් දෙවියන්වහන්සේට පූජාවීමටත්, අපි ආරධනා ලැබ සිටිමු. පැරණි ඊශ්‍රායලය මෙන්, එවිට උන්වහන්සේගේ මුදවාගත් සෙනඟ ලෙස අප හඳුනාගනු ඇත. "නුඹලා මුදනු ලැබුවේ රන්රිදී වැනි වූ දිරා යන දේවල් කරණකොට නොව කැලලක්වත් පලුද්දක්වත් නැති බැටළු පැටවෙකුගේ ලේ වැනි වූ ක්‍රිස්තුස්වහන්සේගේ අනර්ඝ ලෙය කරණකොට ගෙන බව............" (1 පේ‍්‍රතැස් 1:18-19)

## ක්‍රිස්තුස්වහන්සේ සමඟ අනන්‍ය වීම

ස්වාමිවූ යේසුස්වහන්සේ සමඟ අනන්‍ය වීමේ පළමුවෙනි ක්‍රියාව බෞතිස්මයයි. නමුත් මිනිසා කොතරම් මෝඩ සහ අමතකවන සුළු බැව් දැයි දෙවියන්වහන්සේ දන්නා සේක. එම නිසාඔවුනට අමතක වේ යැයි සැකයෙන්, උන්වහන්සේ ඊශ්‍රායෙල් හට වාර්ෂික පාස්කු උත්සවය ස්ථාපිත කළා සේම, ක්‍රිස්තියානින් හටද තමන් මුදවා ගත් සෙනගක් බැව් මතක් වීමට මඟක් සපයා ඇත. ඔවුන්ගේ ගැළවුම්කාරයාණෝ තමන් උදෙසා මියගිය බැව් අමතක වේය යන සැකයෙන්,

ඔවුන්ගේ ස්වාමීන්ගේ ශරීරය සහ රුධිරය සංකේත කළ පූප ගැනීමටත් මිදියුෂ පානය කිරීමටත් ගෝලයෝ බැඳී සිටිති. මෙම වතාවත හඳුනාගැනීමේ සංකේතයක් වෙයි. "මාගේ මාංසය කන්නාවූ මාගේ ලේ බොන්නාවූ තැනැත්තේ මා තුළෙහි පවතියි. මමද ඔහු තුළෙහි පවතිමි" (යොහන් 6:56) අපොස්තුලුවරුන්ගේ දවසේ සිට අදහන්නන්, මෙම අනුස්මරණ උත්සවය සතිපතා පවත්වා තිබේ.

පිත්තල සර්පයා නපුරේ විනාශය සංකේතවත් කරන අතර පාස්කු බැටළුවා යහපත් දේ නැවත දෙවියන්වහන්සේට දීම සංකේතවත් කරයි. එහි එකතුව, යේසුස්වහන්සේගේ මරණයෙන් සම්පූර්ණ කරණ ලද දේ සහ උන්වහන්සේගේ අනුගාමිකයන්ගෙන් බලාපොරොත්තු වන්නාවූ සියල්ල සංක්ෂිප්ත කරයි.

මිනිස් ස්වභාවය නපුරු අතර දෙවියන්වහන්සේට පිළිකුල් සහගතය. එය විනාශ කළ යුතුය. මෙය පිත්තල සර්පයාගේ පාඩමයි. නමුත් ජීවිතය පවා, සියලු යහපත් දීමනා දෙවියන්වහන්සේගෙන් පැමිණි අතර, එය පූජාවක් ලෙස උන්වහන්සේට නැවත දිය යුතුය. මෙය පාස්කු බැටළුවාගේ පාඩමයි.

## දෙවියන්වහන්සේට අපගේ ජීවිත කැපකිරීම.

ජීවිතයත්, යහපත් සියල්ලත් දෙවියන්වහන්සේට කැප කිරීමට මිනිසුන් මනාප නොවෙති. නමුත්, දැනුත් උන්වහන්සේගේම වන දේ නැවත මැවුම්කාරයාණන් වහන්සේට දීමෙන් ඔවුන් පාඩු විඳින්නන් වන්නේ කෙසේද? ස්වාමිවූ යේසුස්වහන්සේ උන්වහන්සේගේ ගෝලයන්ට "යමෙක් තමාගේ ජීවිතය ගලවාගන්ට කැමතිවේද, ඒක ඔහුට නැතිවන්නේය. මා නිසා තමාගේ ජීවිතය නැතිවන අයට ඒක සම්බවන්නේය."

(මතෙව් 16:25) යන ප්‍රතිපත්තිය මත විශ්වාසය තබන්නටත් ක්‍රියා කරන්නටත් උනන්දු කළ සේක.

ජීවිතයේදීත් මරණයේදීත් යේසුස්වහන්සේ මෙම ප්‍රතිපත්තිය උත්කෘෂ්ඨ කළ අතර උන්වහන්සේගේ මහිමාන්විත උත්ථානයෙන් එය සත්‍යයක් බැව් ඔප්පු කළ සේක. මරණය තුළින් සදාකාල ජීවිතයට උන්වහන්සේ අනුගමනය කිරීමට උන්වහන්සේ අපට ආරාධනා කළ සේක. එවන් අනුග්‍රාහී දීමනාවක් අපි ප්‍රතික්ෂේප කරන්නෙමුද?

- පීටර් වොට්කින්ස් -

## ප්‍රශ්න

1. යේසුස්වහන්සේගේ මරණයට වගකිව යුත්තේ කවරෙක්ද? ඒ ඇයි?

2. කුමණ ජාතියක් හෝ මිනිස් කණ්ඩායමක් යේසුස්වහන්සේ හට මෙම දෙයම කරාවි යන්න සත්‍යය වන්නේ ඇයි? දෙවියන්වහන්සේට සේවය කිරීම තම අභිලාෂය කරගත් අයෙකු කෙරෙහි මනුෂ්‍යයෝ ඉවසා දරා නොසිටින්නේ ඇයි?

3. මිනිසා දෙවියන්වහන්සේ සමග භේදවූයේ කෙසේද? පටන්ගැන්මේදී ඒදන් උයනේ වූ සිද්ධි විස්තර කරන්න.

4. මරණය යනු පාපය නිසා දෙවියන්වහන්සේ පැනවූ දඬුවමයි. අප මියගිය විට කුමක් සිදුවන්නේද?

5. පාපයෙන් සහ මරණයෙන්, මිනිසුන් සහ ගැහැණුන් දෙවියන්වහන්සේ කෙසේ ගැලවීද?

6. අප සතු මාංශයේ සහ රුධිරයේ ස්වභාවය යේසුස්වහන්සේ දැරීමේ වැදගත්භාවය කුමක්ද?

7. යේසුස්වහන්සේ පාපය ජයගත්තේ කෙසේද?

8. යේසුස්වහන්සේ නැවත ජීවිතයට නැගිටුවා උන්වහන්සේට අමරණීයත්වය දෙවියන්වහන්සේ දුන්නේ ඇයි?

9. අප ක්‍රිස්තුස්වහන්සේ සමග ,පාපය සහ මරණය මත උන්වහන්සේගේ ජයග්‍රහණයේ කොටස්කරුවන් වන්නේ කෙසේද?

10. යේසුස්වහන්සේගේ මරණය සමග සතුන් දෙදෙනෙකු බයිබලය සම්බන්ද කර ගනියි. එවුන් මොනවාද? එවුන්ගෙන් අප ඉගෙන ගත යුතු යැයි දෙවියන්වහන්සේ බලාපොරොත්තු වන විශේෂ ගති ලක්ෂණ මොනවාද?

11. පළමු ක්‍රිස්තියානින්ගේ දර්ශනය අනුගමනය කර ඔබ "ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසිගතවන්නට" අදහස්කරන්නේ නම්, පළමුව කළ යුත්තේ කුමක්ද? ඔබ නොනවත්වා කරගෙන යා යුත්තේ කුමක්ද?

12. තමන් මුදවාගනු ගැබූ ජනතාවක් බැව් සිහිවීම පිණිස තම ගෝලයන් හට යේසුස්වහන්සේ සපයා ඇත්තේ කුමක්ද?